දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ……………………………

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. — ED/01/14/02/03

දිනය / திகதி / Date — 2012/10/12

චක්‍රලේඛ අංක: 40/2012

පළාත් අධ්‍යාපන ලේකම්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
විදුහල්පති

<u>රජයේ පාසල් සඳහා විද්‍යා උපකරණ හා රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම හා බෙදා හැරීම</u>

රජයේ පාසල් සඳහා විද්‍යා උපකරණ මිලදී ගැනීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් අධ්‍යාපන. උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ලේකම් විසින් 1993/10/15 වන දිනැති නිකුත් කර ඇති 1993/21 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර මින් ඉදිරියට පහත සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට මෙයින් උපදෙස් දෙමි.

01 රජයේ පාසල්වල විද්‍යාව ඉගැන්වීම සඳහා අවශ්‍ය වන අවම විද්‍යා උපකරණ ලැයිස්තුව හා එම උපකරණ සඳහා වලංගුවන පිරිවිතර ලේඛනය මේ සමග ඉදිරිපත් කර ඇත.

02 මෙම ලේඛනයේ ඇමුණුම 1 දරණ ලැයිස්තුවට අදාල විද්‍යා උපකරණ අධ්‍යාපන අමාත්‍යාංශය. පළාත් දෙපාර්තමේන්තුව හා පාසල් මගින් නියමිත මුදල් රෙගුලාසි වලට අනුකූල වන සේ මිලදී ගත හැකිය.

03 ඇමුණුම 1 හි 6 - 11 ශ්‍රේණි සඳහා සඳහන් අයිතමයන්හි සංඛ්‍යා දක්වා ඇත්තේ 6 - 11 ශ්‍රේණි වල සිසුන් 500 ක් හෝ ඊට අඩු කණ්ඩායමක් සඳහාය. ඊට වැඩි වන සෑම 500 ක කණ්ඩායමක් සඳහාම අතිරේක කට්ටලය බැගින් මිලදී ගත හැක.

04 ඇමුණුම 1 හි අ පො ස (උ පෙළ) ශ්‍රේණි සඳහා සඳහන් අයිතමයන්හි සංඛ්‍යා දක්වා ඇත්තේ අදාළ විෂයය හදාරන සිසුන් 80 ක් හෝ ඊට අඩු එක් කට්ටලයක් සඳහාය. සෑම වැඩිවන සිසුන් 80 කටම අතිරේක කට්ටලය බැගින් මිලදී ගත හැක.

05 ඇමුණුමෙහි අංක 4.000 යටතේ දක්වා ඇති උපකරණ පාසල් මට්ටමින් පමණක් මිලදී ගත යුතුය. මේ සඳහා ගුණාත්මක යෙදවුම් මුදල් භාවිතා කළ හැක.

06 ස්ථිර උපකරණ සියල්ල පොදු 44 බඩු වට්ටෝරු පොතට ඇතුලත් කල යුතු අතර රසායන ද්‍රව්‍ය හා නශ්‍ය ද්‍රව්‍ය පොදු 198 තොග පොතට ඇතුලත් කල යුතුය.

07 ලේඛනයේ සඳහන් නොවන කිසියම් විද්‍යා උපකරණයක් මිලදී ගැනීමට අවශ්‍යය වන කල්හි එම උපකරණයේ පිරිවිතර හා එහි අවශ්‍යතාව අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය. එබඳු අවස්ථාවන් වලදී එම ඉල්ලීම විද්‍යා විෂයය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර ඒ සඳහා අවශ්‍යය අනුමැතිය ලබා දෙනු ඇත.

ඉදිරියේදී සිදුවන විෂයමාලා සංශෝධනයන් අනුව ලේඛනයේ සඳහන් ස්ථිර උපකරණ. රසායන ද්‍රව්‍ය හා නශ්‍ය ද්‍රව්‍ය වල වෙනස්කම් සිදුවිය යුතු බැවින් වසර 05 කට වරක් මෙම ලේඛනය සංශෝධනය කළ යුතු වේ. ඊට අමතරව මෙම ලේඛනයේ සඳහන් අයිතමයක් ඉවත් කිරීම හෝ ලේඛනයට ඇතුළත් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ සහභාගීත්වයෙන් විද්‍යා මෙහෙයුම් කමිටුව මගින් සිදු කරන නිර්දේශ අනුව සිදු කළ යුතුය.

එස් එම් ගෝඨාභය ජයරත්න
අධ්‍යාපන ලේකම්